**සොරණාතොට ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 19 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අගෝස්තු 05 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති සොරණාතොට ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,358,593 ක් වූ සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාගත් දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ශේෂය රු.5,616,609 ක් ලෙස දැක්වීම නිසා බැරකම් රු.2,741,984 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත සඳහා ලැබිය යුතු රු.790,236 ක් ගිණුම්ගත නොකර්මෙන් මූලධන ආදායම හා 2012 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) රු.1,288,118 ක් වූ සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.1,132,338 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම හා දෙසැම්බර් 31 දිනට ණයගැතියන් රු.155,780 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ලංකා බැංකුවේ බදුල්ල අධිශ්‍රේණි ශාඛාවෙහි පවත්වාගෙන යන ලබන ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂ සහතිකය හා බැංකු පාස්පොත අනුව රු.110,285 ක් වූ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.194,009 ලෙස රු.83,724 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.648,018,755 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,180,202 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,241,585 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 උනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 3,735 | 4,799 | 227 |
| (ii) | බදු කුලී | 996 | 640 | 15 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 340 | 531 | - |
| (iv) | වෙනත් ආදායම් | 10,584 | 7,684 | 3,990 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 250,000 |
| (ii) | මුද්දර ගාස්තු | 1,200,000 |

2.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු වූ රු.41,947 ක මුද්දර බදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) විවිධ පාර්ශවයන් වෙත දෙන ලද අත්තිකාරම් රු.143,740 ක් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව 2012 දෙසැම්බර් 31 දිනට පියවාගෙන නොතිබුණි.

(ඇ) අවස්ථා 11 කදී තැන්පත් කර වසර 02 ක් ඉක්මවූ රු. 115,144 ක තැන්පත් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නියාදනය කර නොතිබුණි.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය හේතුවෙන් පහල දෙහිලන්ද ගමට ජලය ලබාදීම සඳහා 2012 උපමාන පාදක ආධාර යටතේ සභාවට ලැබී තිබුණු රු.50,000 ක් එම කර්මාන්තය ඉටු නොකර ඌව පළාත් සභාව වෙත ආපසු යවා තිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය